**1. නිල් උපුලේ**

නිල් උපුලේ වත කමලේ
රත ලවනේ පටු නලලේ
රස අඳුනේ සිත බැඳුනේ
දඟකාරයි රැය සොඳුරේ

මිණි මෙවුලේ ඇස රැඳුනේ
සිත දැහැනේ සිල් බිඳුනේ
සිරි යහනේ සුව දැනුනේ
පා සළඹේ මිණි සැලුනේ

ඔබ උර මඩලේ සැතපෙමි නිබඳේ
අංජන තවරා කොපුලේ

දඟ යුග සයනේ රතදර බඳුනේ
පැන් සනහාලමි ලඳුනේ

මිණි මෙවුලේ .......

පෙම් රඟ මඬලේ මන්දිර මිදුලේ
රෑ තුන් යම නිදි වරමි

තරු මල් හෙවනේ පෙම්බර හිමිගේ
විලි බර නෙත් යුග වසමි

**පද - ගීතනාත් කුඩලිගම**
**සංගීතය - වික්ටර් රත්නායක**
**යුග ගායනා නෙලු අධිකාරි**

**2. යලි නොඑනා ගමනක්**

හේ අහිං හේලි අහිං

යලි නොඑනා ගමනක් දෝ
නිම නොවෙනා ගමනක් දෝ

ලීනි අහින පාර කියන්නේ
මාළු අහින පෙරලි කරන්නේ
මුදේ කසු කුසුව ඇසෙන්නේ
දෑත දෙපා කඳුළු සලන්නේ

යොතේ තිඹිරි සුවඳ දැනෙන්නේ
පැලේ සුවඳ සුළඟ ගෙනෙන්නේ
දියඹේ අප තනිව හිඳින්නේ
වෙරළේමයි සිත ගැවසෙන්නේ

**පද - මහාචාර්ය සුනිල් ආරියරත්න**
**සංගීතය - වික්ටර් රත්නායක**

**3. සිත් සනහාලන**

සිත් සනහාලන මුතුවන් වරුසා
කඩා හැලෙනවා බුදු සමිඳේ
මෙත් සිලිලාරේ කරුණා ගංගා
ගලා බසිනවා භව කතරේ

සත් කුළු පව්වෙන් සත් මහ සයුරෙන්
ඈත එපිට බුදු රැස් විහිදේ
සත් පියුමන් මුනිඳුන්ට පිපිලා
සුවඳ ගලනවා සිරිපාදේ

ක්ලේෂ දවාලන රාග නිවාලන
ඔබ දැක ගන්නයි මා ආවේ
නෙත් ලැබුනා මට ඔබ දුටු පමණින්
දොරටුව හමුවේ නිවන් පුරේ

**පද - තලංගම ප්‍රේමදාස**
**සංගීතය - වික්ටර් රත්නායක**

**4. දෙතොලග සිනහා**

දෙතොලග සිනහා ආදර කැල්මෙන් නැහැවේ
පෙම්රස අනා අමුනයි සුන්දර තාවේ
නුවනග බැලුම් නිහඬව ගැයු ගී රාවේ
මදුරස පිරේ සවනත මී විත යාවේ

දේදුනු දෙබැමි නැලවෙන සිත සුව යහනේ
මිහිරක් දැනේ හදවත අඩ සඳ පහනේ

ලෝ තුල සදා මියයන මල් පිපි සෙවනේ
ඔබ මට මදාරා මලෙකිය පිය ලඳුනේ

**පද - ඩබ්ලිව්.එම්.ටී. බණ්ඩාර**
**සංගීතය - වික්ටර් රත්නායක**

**5. ඇස ප්‍රීති කරන රූපා**

ඇස ප්‍රීති කරන රූපා
නැතිවී යතිය නොහැඟී
නොදිරාවී නාමේ සුන්දා
පවතී දනන්ගෙ සිත් හි

මෙම ලෝකෙ පාපයේ ගැලී
විසුවොත් දුක නියමයි
ත්‍රිවිධ ලෝක සැප ලැබීමට
පංච පාපයෙන් මිදීලා

මුනිඳුන් දෙසූ එ ධර්මා
සිත් සේ රකීවි මෙත පා
ත්‍රිවිධ ලෝක සැප ලැබීමටා
පංච පාපයෙන් මිදීලා

**පද - නීතිඥ ජෝන් ද සිල්වා**(මානාභරණ කෘතියෙන්)

**6.සිනා දොලක් වන්**

සිනා දොලක් වන් සිනා මලී
මල්වර නැකතින් දොරට වඩින සුදු සිනාමලී
බලා උන්නෙ එනතුරු පෙර වාගෙ
ඇයි පිට පාරෙම අද

පෙරට වඩා අද හැඩකාරයි - ආඩම්බර පාටයි
නාඳුනනා ලෙස කෝල බැලුම් නෙත
නොදැක හිටිය ටික දවසට වෙනස් වුනාදෝ
ඇයි හිනා නැතිව අද

වදුලු පුරා දං හිඹුටු සොයා
කෙළි දෙලෙන් නිදැල්ලේ
දුව පැන හිනැහුනු පුංචි කිරිල්ලිය
නුඹේ ලපටි සිත දෙගුරුන් අවුල් කලාදෝ
ඇයි කථා නැතිව  අද

**පද - කුලරත්න ආරියවංශ**
**සංගීතය - වික්ටර් රත්නායක**

**7. ඇයගේ ඇකයෙහි**

ඇයගේ ඇකයෙහි ඔබ හිස රඳවා
සැනැහුනු මොහොතක ඔබේම දෙනෙතින්
මා ඔබ දුටුවා - ඇයට නොවේ
ඔබට පමණි ඔබ ආදරේ

වසන්ත දෙකොපුල නිදි වැරූ තොල් මල
දසැඟිලි තුඩු අග  පිබිදුණු රණ හස
ඇයට  ආදරේ  ආදරේ මම
ඇයට ආදරේ ආදරේ

ඇගේ සුරත ගෙන පිනි විල්ලුද මත
ඇයට ඇලුම් බව ඔබ පැවසූ පසු
පෙරලා ඔබ හට පෙම් කරනා බව
ඇය මුමුණන සඳ ඔබ සිත සුවපත් වේ

ඇයට පමණි මම ආදරේ
ඔබට පමණි ඔබ ආදරේ

**යුග - පණ්ඩිත් ඩබ්ලිව්.ඩී.අමරදේව**
**පද - බණ්ඩාර කේ. විජේතුංග**
**සංගීතය - වික්ටර් රත්නායක**

**8. සාගර ජලය**

සාගර ජලය මදි හිමි  ගුණ ලියන්නට
අහසේ තාරුකා මදි ගුණ ගනින්නට
පොලොවේ වැලිවලින් බෑ ගුණ  මනින්නට
හඳටත් ඉරටවත් බෑ ගුණ කියන්නට

සුළඟට බැරිය අපමණ ගුණ බෙදන්නට
හඬකට බැරිය නිම නැති ගුණ ගයන්නට
පසතුරු නදටවත් බෑ ගුණ වයන්නට
දෙසවන මදිය හිමි වරුනය අසන්නට

දොලකට බැරිය හිමි සිරිපද දොවන්නට
පින්නට බැරිය හිමි සිරිපද තෙමන්නට
මිනිසත් බවය ලත් මට බැරි ලබන්නට
මල කළ පින කවර ඔබ ලඟ මියෙන්නට

**පද - ප්‍රේමකීර්ති ද අල්විස්**
**සංගීතය - වික්ටර් රත්නායක**

**9. සිරිමා බෝ මැඩ**

සිරිමා බෝ මැඩ මුනිඳුන් වැඩ හිඳ
දසමර සේනා දිනූ බෙලෙන්
ජය පැන් කරඬුව දෝත දරා
නිදන්න දූ කුමරී

බක්කුල මහ තෙරිඳු බෙලෙන්
නිදුක් නිරෝගී වේවා
සූවිසි මුණි ගුණ පින් මහිමෙන්
නිරතුරු ආයු වැඩේවා
අසූ සාර දහසක් දම් තෙද කඳ
සෙවන දෙවා සුරකීවා

සිරි දළදා සමිඳු නමින්
ලතෙත් ගුණය ඉතිරේවා
වම් සිරිපා රන් පද්ම බෙලෙන්
අනන්ත නුවණ  වැඩේවා
මහා සීවලී මහිමි අනුහසින්
ඉසුරු සැපත් බෝ වේවා

**පද - අචාර්ය අජන්තා රණසිංහ**
**සංගීතය - වික්ටර් රත්නායක**

**10. ලබලා තිදසා**

ලබලා තිදසා පුරයේ සැපතා
නොලදිමි සුව හදටා
රජකුල සිරිතා රුපුසෙන් සේමා
වඩනා පෙම මඩනා

යමුනා තෙරෙහී හසඟන සේමා
සඳවන් වත දිලෙනා
නොකලාදෝ මා කුසලා බෝමා
යුවතී නුඹ ලබනා

හැරදා පිදෙනා නර්තන ජාලා
අභිමන් රජ කිරුළා
තනිවෙමි හිමයේ ගිරිලෙන් සෙවනා
සොවිනා සිත දවනා

**පද - වසන්ත කුමාර කොබවක**
**සංගීතය - වික්ටර් රත්නායක**

## 11. කොහේද කොහේද අපේ

කොහේද කොහේද අපේ ලොවක්
කොහේද කොහේද අපේ රටක්
මුරකාවල් නැති වැටකොටු බැමි නැති
අපේම අපේම නවාතැනක්

රාජ කුමාරයන් කුමාරියන් ඉන්න පලාතක්
නපුරු රාස්සයන් රාස්සියන් ඉන්න කැළෑවක්
පුංචි සුරංගනාවන් සැඟවී ඉන්න වලාවක්
අපට හිතුමතයේ රජ කරගෙන ඉන්න දිහාවක්

කිඳුරු විමානයට පාර ළඟයි එන්න යාළුවේ
මුදු හතක් එහා ඔරු පදින්න එන්න යාළුවේ
මකර කටින් නාග භවනට යමු එන්න යාළුවේ
අපිට අපේ ලොවක් සොයා ගන්න එන්න යාළුවේ

**පද - මහාචාර්ය සුනිල් ආරියරත්න**
**සංගීතය - පණ්ඩිත් ඩබ්ලිව්.ඩී.අමරදේව**
**චිත්‍රපටය - මඩොල් දූව**

## 12. අමා දිය දහර

අමා දිය දහර ඔබයි ළඳුනේ
නිවාලන්න මා සරතැස
අමා ඔසුව ඔබයි පිය ළඳුනේ
ගිලාන වූ ආතුර මට
සූරිය වච්චසාවියේ

ගිමත් සමේ තැවෙන ඇතෙක්
සිහිල් විලේ ගිලෙනා සේ
සරැළි නඟන ඔබෑ තුනුවිලෑ
මා සනහාලන්නේ
සූරිය වච්චසා

ළහිරු කිරණ කළඹක් සේ
පැහැසර නව ප්‍රභාතයේ
දිලෙන ඔබේ රුසිරු වරුණ
මා නෙතු බැඳලන්නේ
සූරිය වච්චසා

**පද - රත්න ශ්‍රී විජේසිංහ**
**සංගීතය - වික්ටර් රත්නායක**

## 13. නිලා නිල් පැහැ

නිලා නිල් පැහැ බරින වන වදුලු මෝරනා
දුලා පිපි තුරු අරා මත් කොවුල් ගායනා
සනාතන දම් රසින හදින් හද පේවෙනා
පුරාණෝ බණ කතා රස මීර යාවෙනා

පුරා සඳ රැස් ගලා වලා මඟ සේදෙනා
එලා රන් කසී සළු දෙව් බඹුන් සතොසිනා
සලා චාමර බලා හිඳිති බැති පේමෙනා
ලොවී ලොව්තුරු මහා රහත් ගණ එන සැනා

රන් තාරකා පිපෙන දුර ගගන වාසනා
රන් වණින් මල් බරවූ නිල් දෙරණ වාසනා
පින් සිරින රන් පෑති කොත් කැරලි වාසනා
සුන්දර මෙ අනුරපුර වාසනා

**පද - අධිනීතිඥ ඩබ්ලිව්.ඒ. අබේසිංහ**
**සංගීතය - වික්ටර් රත්නායක**

## 14. අළුත් දවසක

අළුත් දවසක
අළුත් වෙරළක
අළුත් ගීතය ඇසේවී
අළුත් අරුතක් දැනේවී

අළුත් හෙවනක
අළුත් යහනක
අළුත් හීනය බිඳේවී
අළුත් මිහිරක් දැනේවී

පිපෙන මලකින් සුවඳ අරගෙන
හමා යද්දී මාරුතේ
උදම් නොවෙමින් තුරෙහි හිනැහෙන
එමල පහදයි ජීවිතේ

හෙලන සුසුමක රැඳුනු දුක දැක
සසල වෙයි ගහ කොළ පවා
එවන් සුසුමක් උපන් හදවත
සසල නැති හැටි රෑ දිවා

**පද - බන්දුල නානායක්කාරවසම්**
**සංගීතය - වික්ටර් රත්නායක**

**15. දිගු කේශ කල්‍යාණියේ**

දිගු කේශ කල්‍යාණියේ
ඉඳු නීල නයනාවියේ
රන හංස කුසලාන
පුරවන්න මධු පාන
සනසන්න මා පවස කල්‍යාණියේ

රෑ තනි නින්ද මට නේන - දුක ගේන මේ යහන
සැතපෙන්න මගෙ සිහිනයේ
මල් මකරන්ද මට දෙන්න
බැහැ මෙදුක විඳවන්න සැඟවෙන්න මා දෙනයනේ

මා හද පැතුම ඔබ නේද ඉටු වේද සුන් වේද
පෙම් රසය ගෙන එන්නියේ
අපි එක්වෙමුද වෙන් වෙමුද
මේ ලෙසම දුක් වෙමුද පවසන්න මිහිරාවියේ

**පද - ගීතනාත් කුඩලිගම**
**සංගීතය - වික්ටර් රත්නායක**

**16. හිමිකාරි ඔබයි**

හිමිකාරි ඔබයි මගෙ ජීවිතයේ
ජීවිතය මට නොදුන්නු
හිමිකාරි ඔබයි මගෙ ජීවිතයේ
ආදරය මට නොපෙන් වූ

සිත හඬා වැටෙන දුක්බර මොහොතේ
සඳ පිපී සැඟවිලා ගියෙ කොතැනේ
ඔබ මගෙන් ඈත්වී ගිය මොහොතේ
දුක දරාගන්න හැකි වෙද කෙලෙසේ

තරු කඩා වැටුණු කරුවල අහසේ
ඔබ තනි තරුවයි පිපි හද මඬලේ
මල් පිපී පරව ගිය මල් උයනේ
ඔබ සුවඳ මලයි මගෙ හද උයනේ

**පද - බුද්ධදාස ගලප්පත්ති**
**සංගීතය - වික්ටර් රත්නායක**